4

පැතිකඩ

ආචාර්ය පාලිත ගනේවත්ත

ඩී. බී. කුරුප්පු මහතාගේ සාහිත්‍ය සේවාව ගැන මා ලියන ලිපි පෙළේ මෙවර මා ලියන්නේ ඩී. බී. ගේ කෙටි කතා පොත් තුනක් පිළිබඳවයි. ඩී. බී. ඕස්ට්‍රේලියාවට පැමිණි පසු ලියූ පළමු කෙටි කතා පොත වන 'ලංකාවක් වගේ පුංචි' (1998), 'අන්තිම උපන් දින සාදය' (2000) හා 'නරා වළ හා කළු හිල' (2001) එම කෙටි කතා පොත් තුනයි. ඩී. බී. 2002 දී ලියා පළ කළ 'විප්ලවය ආවොත්' නම් වූ කෙටි කතා පොත ගැන ගිය වර ලිපියෙන් විමසුමක් කළෙමි.

ඩී. බී. 2005 දී 'හැන්දෑවට පායන හිරු නොහොත් යුගයක අත් දැකීම්' නමැති පොත පළ කළේය. ඩී. බී. මගේ කතාව ලෙස හඳුන්වන ඔහුගේ ජීවන පුවත් ඇතුළත් එම පොතේ ඔහු ලියූ බොහෝ පොත පතට පාදක වූ චරිත හා සිදුවීම් ගැන සඳහන් කර ඇත. ඩී. බී. කුරුප්පු මහතාගේ සාහිත්‍ය නිර්මාණ විමසීමේදී මෙන්ම ඒවා කියවා රස විඳීමේදීද 'හැන්දෑවට ...' පොත කියවීමෙන් මහත් පිටුවහලක් ලැබෙයි. මේ ලිපියෙන් මා විමසුමට ලක් කෙරෙන කෙටි කතා වලින් ආස්වදයක් ලැබීමට හොඳම මග ඒ කෙටි කතා සමගම 'හැන්දෑවට පායන හිරු' පොත සමාන්තරව කියවීමයි.

ඩී. බී. ඕස්ට්‍රේලියාවට පැමිණි පසු ලියූ පළමු කෙටි කතා පොත වන 'ලංකාවක් වගේ පුංචි' 2000 වසරේදී ඔැබෙහ ඔසබහ්රස බ්බන් නමින් ඉංග්‍රීසි බසින්ද පළ විය. කෙටි කතා දහයකින් සමන්විත එහි හොඳ කෙටි කතාවක ස්වරූපයක් දරන නිර්මාණයන් ලෙස හැඳින්විය හැක්කේ පොතේ අන්තිම කතාව වන 'පුහුල් පාන' නම් වූ කෙටි කතාවයි.

කතා නායකයා වන සරණපාල මහතා වෙසක් දිනක ලංකාවට යැවීමට ලිපියක් ලියන්නට පටන් ගත් අවස්ධාවේදී ඔහුගේ මේසය මත තබා ඇති වෙසක් සැරසිලි රැගත් කැලැන්ඩරය වෙත ඔහුගේ අවධානය යොමු වෙයි. සරණපාල මහතාගේ අතීතාවරජනය ඔස්සේ ඉතා සුළු මොහොතකදී බොහෝ දේ විස්තර කෙරෙන 'පුහුල් පාන'ට යොදාගෙන ඇති ආකෘතිය ඉතාම සුදුසුය. මෙරටට සංක්‍රමණය වන දෙමාපියන් හා දූ දරුවන් අතර සමාජ හා සංස්කෘතික ගැටුම නිරූපණය කරන සාර්ථක කෙටි කතාවකි.

'පුහුල් පාන' ගැන කතුවරයාගේ අදහස් මෙහි බහාලීමට මට සිතේ.

'පුහුල් පාන' මේ කෙටි කතා එකතුවේ වන හොඳම නිර්මාණය ලෙසින්ය මා දකින්නේ. එහි එන සරණපාල මහතාගේ කතාව මගේම කතාවය. (හැන්දෑවට ... පිට 311)

උත්තම පුරුෂයෙන් ලියවී ඇති 'යුද සමරුව' සටන් වලින් මිය ගිය යුද සෙබලුන් සිහි කරන පෙළපාලියක් නරඹන්ට ගිය විට දී කතා නායකයා යෙදෙන අතීතාවර්ජනයකි. මෙහි දී ලංකාවට ජපනුන් බෝම්බ දැමූ කල කුඩා පාසල් දරුවකුව සිටි කතා නායකයා සිය අත්දැකීම් ඒ අයුරින්ම වාර්තා කර ඇත. ඒ ආවර්ජනය තුළින් කිසියම් සිදුවීමක් හෝ දෙකක් තෝරාගෙන එය ඕස්ට්‍රේලියා යුද සමරුව හා ගටා කෙටි කතාවක් නිර්මාණය කිරීමට ප්‍රයත්නයක් දැරුවේ නම් හොඳ කෙටි කතාවක් බිහිවන්නට තිබිණි.

'ලංකාවක් වගේ පුංචි' කෙටිකතා එකතුවේ සියළුම කතා කියන්නේ 'මා' විසින්ය. මා කලින්ද සඳහන් කළ පරිදි උත්තම පුරුෂයෙන්ය. කෙටිකතාවලින් නිරූපණය වන විවිධ චරිත දෙස කතා නායකයා වන 'මා' ගේ අදහස් පමණි පාඨකයාට දත හැක්කේ. එය කෙටි කතාවක අත්‍යවශ්‍ය අංගයක් වන චරිත නිරූපණයට බාධාවක් වන බව කලින් ලිපියෙන්ද මම පෙන්වා දුන්නෙමි.

'බල සේනානායක' යන කතාව කතා නායකයා දෙහිදෙණිය නමැත්තකු සමග මෙල්බර්න් නගරයේ පැවැත්වෙන සපුමල් ව්‍යාපාරය පිළිබඳ රැස්වීමකට සහභාගි වීමට යන අතර දෙදෙනා ශ්‍රී ලංකාවේ පැරණි දේශපාලන පුවත් ගැන කරන කතා බහෙන් සමන්විතය.

'ප්‍රඥා සාගරය අබියස' යනු මෙල්බර්න් නගරයට පැමිණි දලයි ලාමාගේ දේශනාවකට සවන්දීමට ගිය කතා නායකයාගේ අදහස් වලින් පිරුණු කතාවකි. දේශනය අතර වාරයේදී කතා නායකයා තුළ ඇතිවන ලෝක දේශපාලනය අදාල සිදුවීම්ද විස්තර කෙරෙන මෙම කෙටි කතාවට ඉහළ ලංසුවක් දෙන්නට තමන් තැත් නොකරන බව කතුවරයා පවසා ඇත. (සැන්දෑවට ... පි. 310)

'සාගර ජලය මදි හැඩුවා ඔබ සන්දා' කතාවේදී කතා නායකයා මෙල්බර්න් නුවර ජනවාර්ගික ගුවන් විදුලි වැඩ සටහනක 'මව් දිනය' ගැන වැඩ සටහනකට සහභාගී වෙයි. එය පටිගත කිරීම සඳහා දුම්රියෙන් යන ගමනත් කතා නායකයාගේ සිතට නගින සිතිවිලිත් ඒ කතාවෙන් විස්තර වෙයි.

මෙල්බර්න් නුවර පැවති සිංහල විවා මගුලකට සහභාගී වූ කතා නායකයාගේ අත්දැකීම් විස්තර කෙරෙන 'පුන් කලස් හා තණ මිටි' නමැති කතාවේ මුල් කොටස ස්වයංභාෂණයක ස්වරූපය ගත්තත් කතාවේ අවසන් කොටසන ජයතිස්ස හා රිචඩ් උණම්බුව යන චරිත එක්වීමන් කෙටි කතාවක ස්වරූපය ලැබී ඇත.

ඕස්ට්‍රේලියාවේ පුරවැසිකම ලබාගත් මෙල්බර්න් නුවර වාසය කරන සිංහලයකුගේ සිත තුළ තම මව් බිමට ද්‍රෝහී වූයේය යන සිතිවිලි නගියි. එම සිතිවිලි ගැටුමින් එයින් මිදෙන්නට ඔහු සිත සමග කරන අරගලයත් නිරූපණය කරන 'නිජ බිමේ යහපත තකාමයි' නමැති කතාව ආඛ්‍යාන ස්වරූපය ගත් කෙටි කතාවකි.

හිතවතකුගේ අවමගුල් උත්සවයකට සහභාගී වීමේදී කතා නායකයාගේ සිත තුළ උපන් සිතිවිලි මෙන්ම මෙරට හා ලංකාවේ අවමගුලක වෙනස් කම් ගැන ඔහු දරණ අදහස් 'පිණි බිඳු හා කඳුළු බිඳු' කතාවට පාදක වී ඇත.

මෙල්බර්න් නුවරදී මිතුරකුගේ දියණියකගේ විසි එක් වන ජන්ම දින උත්සවයකට ගිය ගමනක් හා එහි දී ඇසූ දුටු දේ හා සිතුනු සිතුම් ගෙන හැර දක්වන කතාවකි 'උඩ ගියද' නමින් ඇති කෙටි කතාව.





කෙටි කතා සංග්‍රයට නම ලැබී ඇති කතාව මේ කතා එකතුවේ පළමු කතාව වන 'ලංකාවක් වගේ පුංචි'ය.

ඩී. බී. ගේ වචනයෙන්ම කිව හොත් එම කෙටි කතාව 'මෙහි ආ අපේ ඇත්තන්ගෙන් ප්‍රදර්ශණය වන සුපුරුදු පටු අදහස් - පුහු මාන්නය හා කුඩුකේඩුකම් මතු කර පෙන්වන කතාවකි.

'ලංකාවක් වගේ පුංචි' කෙටි කතා එකතුවේ වැදගත් කම නම් එය ඕස්ට්‍රේලියාවට පැමිණි සිංහලයන්ගේ ජීවන පුවත් ඇතුළත් කොට ලියූ පළමු සාහිත්‍ය නිර්මාණය වීමයි.

ජීවිතයේ බාහිර තොරතුරු අළලා ලියැවුන කතා බොහොමයක් ඇතත් ජීවිතයේ අභ්‍යන්තර පුවත් රැගත් කෙටි කතා එතරම් සුලභ නොවේ. වික්ටෝරියානු සදාචාරය අනුව හැඩගැසුණ සිතුම් පැතුම් ඇති බොහෝ සිංහලයෝ ජීවිතයේ අභ්‍යන්තර අවුල් වියවුල්, ලිංගික ප්‍රශ්න, විවාහ දිවියේ ගැටළු ආදිය සම්බන්ධයෙන් විවෘතව කතා බස් කිරීමට මෙන්ම ලිවීමටද මැලි වෙති. කෙටි කතා නිර්මාණකරුවකු වශයෙන් ඩී. බී. කුරුප්පු මහතා මේ තත්වය ඉක්මවා නොබියව තම දිවියේ අභ්‍යන්තර ගැටළු හෙළි කළ ලේඛකයෙකි. එම අව්‍යාජත්වය හොඳ ලේඛකයකුගේ ලකුණකි.

ඩී. බී. 2000 වසරේදී ලියා පල කළ 'අන්තිම උපන් දින සාදය' කෙටි කතා සංග්‍රහය ඔහුගේ විවාහ දිවිය දෙදරා යාමෙන් පසුව තනිකඩ ජීවිතයක් ඇරඹීම හා බැඳි ඇති අත්දැකීම් රැගත් කතා එකතුවකි. ඩී. බී. ගේ බොහොමයක් කෙටි කතාවලට මෙන්ම අන්තිම උපන් දින සාදයේ කතාද ස්වයංභාෂ වුවද ඔහුගේ බොහෝ කතා වලට නොපිවිසි සංවේදී බවක් මේ කතා වලට පිවිස ඇත.

එම කෙටි කතා එකතුවේ ඇති 'සිරි සමග වරුවක් ගත කළෙමි' ඇත්ත කතාවක් යයි කතුවරයාම පවසා ඇත. (හැන්දෑවට ... පිට 332) කතුවරයාගේ සිතුම් මේ කෙටි කතාව තුළින් මතු වෙයි. කතාව කියවන පාඨකයාට හැඟෙන්නේ කෙටි කතාවක් කියවන්නේ ය යන හැඟීම නොව කතුවරයාගේ ස්වයංභාෂ්‍යයක් ලෙසය.

අන්තිම උපන් දින සාදයේ එන හදවතට තදින්ම කා වදින කතාව 'තාත්තේ මම (අපි) ඔබට ආදරෙයි' නම් වූ කතාවයි. බිරිඳගෙන් වෙන්ව තනිව ජීවත්වන කතුවරයා පීතෘ දිනයේදී දූවරුන් දෙදෙනා බලාපොරොත්තුවෙන් සිතන සිතුම් අතීතාවර්ජනයක් ලෙසින් දැඩි පීතෘ ප්‍රේමයකින් යුතුව මේ කතාවෙන් විස්තර වෙයි. ඒ කාතාවේ අග ඇති කවිය කියවා අවසන් කරන සංවේදී හදවතක් ඇති සහෘදයකුගේ ඇසට කඳුලක් නැගීම වැළැක්විය නොහැකිය. කතාව අවසානයේදී කතා නායකයා මෙසේ සිතයි.

'ඔසී විකාරයක් - මනස්ගාතයක් - යනුවෙන් මෙතෙක් මා සමච්චල් කළ පිතෘ දිනය, දිවි ඇති තාක් අමතක නොවන අර්ථවත් දිනයක් බවට එක මොහොතකින් පරිවර්තනය වූ හැටි! (අන්තිම උපන් දින සාදය - පිට 105)

'අන්තිම උපන් දින සාදය' කෙටි කතා පොතේ සෑම කතාවක්ම එහි තේමාව නිරූපණය කරණ සිතුවමකින් සැරසී ඇත. එයින් කතා කියවීමෙන් සහෘදය ලබන ආස්වාදයට මහත් පිටුවහලක් ලැබෙයි.

ඩී. බී. කුරුප්පු මහතා නිරන්තරයෙන්ම නිර්මාණ කුසලතාවයෙන් වර්ධනය වන ලේඛකයෙකි. නිරන්තර නිර්මාණ අභනසයත් ස්වයං විවේචනයත් නිසා ඩී. බී. තම නිර්මාණවල අඩු ලුහුඬුකම් දකී. එය ස්වාධීනව වැඩෙන නිර්මාණ ශක්තිය පෙන්වන ලකුණකි. නිදසුන් කිහිපයක් පහත දක්වමි.

කෙටිකතා දහයකින් සමන්විත 'නාරාවළ හා නළු හිල' ඩී. බී. 2001 දී පළ කළේය. වරුණ සාවින්ද නිර්මාණය කළ එම පොතේ පිට කවරය ජීවිතයේ ගුප්ත බවක් සිහි කරවන සිත් ගන්නා සිතුවමකින් සැරසී ඇත.

'නාරාවල ...' කෙටි කතා එකතුවේ එන 'අනේ හරි සඳ පළ නෙකළ පොත' නමැති කතාව මෙල්බර්න් නුවර වසර ගණනාවක් ජීවත් වූ පැරැළියේ කා. හරිශ්චන්ද්‍ර වියතානන් පිළිබඳ අත්දැකීම් ඇසුරෙන් ලියවුණ සත්‍ය තොරතුරුය. එම කෙටි කතාව නම් වාර්තාවකට වඩා ගැම්මක් නැති එකක් බව මම කෙලින්ම පිළිගනිමියි ඩී. බී. පවසයි. (සැන්දෑවට ... පිට 354)

'නාරා වළ ....' කෙටි කතා එකතුවේ ඇති 'කළු බුදු සාදු' නමැති කතාව මෙල්බර්න් නගරයේ වෙසක් උත්සවයක් නිමිත්තෙන් පැවති භක්ති ගීත ගායනයකට සහභාගි වූ කතුවරයාගේ අත් දැකීමකි. එය කතුවරයා තුළ ඇති වන අදහස් ගෙඩි පිටින්ම ගෙන හැර දැක්වීමකි. කතාවක් හැටියට එහි ඇති දෙයක් නැතැයි ඩී. බී. පවසා ඇත. (හැන්දෑවට ... පිට 356). එම කෙටිකතා සංග්‍රහයේම එන 'දියසේන ගේ අබිනික්මන' හා 'දිසානායකගේ නඩුව' බැණුමකට සුදුසුකම් ඇති කතා ලෙසය ඩී. බී. හඳුන්වා ඇත්තේ. (හැන්දෑවට ... පිට 357).

'නාරාවළ හා නළු හිල' කෙටිකතා සංග්‍රහයේ 'බැරි වුණු පින්තූරය' නමින් කතාවක් ඇත. එම කතාව කතුවරයාගේ විවාහය දෙදරායාමත්, ඒ තුළින් බලාපොරොත්තු සුන්වීමත් සංවේගජනක ලෙස ඉදිරිපත් කරන වෘත්තාන්තයකි. ඩී. බී. ගේ බොහෝ කතා වලට නොපිවිසි දුක්බර බවක් මේ කතාව තුළ ඇත. මා සිතන හැටියට ඩී. බී. ගේ බොහෝ කතාවලින් ඉස්මතු වන්නේ උපහාස රසයයි. එබැවින් 'බැරිවුණු පින්තූරය' තුළින් දුක්බර හැඟීම හොඳින් මතු වී පෙනේ.

ඩී. බී. කුරුප්පු මහාතගේ කෙටි කතා කියවීමේදී මා තුළ ඇතිවන අදහස් මෙසේය.

විටින් විට ස්වකීය ජීවිතයේදී ලබන අත්දැකීම් ඩී. බී. ගේ නිර්මාණ සිතිවිලි පුබුදුවයි. බොහෝ විටක යම් සිදුවීමක් අරබයා කෙටි කතාවක් ලිවිය යුතු යැයි සිතයි. එම සිතිවිලි ඔස්සේ සිත මෙහෙයවීමේදී කෙටි කතාවක් යනු කුමක්ද? කෙටි කතාව යන සාහිත්‍යාංගයේ ආකෘතිය හා අභ්‍යන්තරය කුමක් විය යුතුද යන්න ඩී. බී.ට මොහොතකට අමතක වෙයි. ඇතැම් කතා ඩී. බී. ලියුවේ ළය විරේකයක් ලෙසිනි (සැන්දෑවට ... පිට 357). තම අත්දැකීම්වලින් කෙටි කතාවකට උචිත දේ පමණක් තෝරා බේරා නොගැනීම නිසා බොහොමයක් කතා වාර්තා ස්වරූපයක් ගනී.

මා ඉත සිතින් පළ කරන මෙවන් අදහස් නිර්දය විවේචනයන් ලෙස බොහෝ දෙනෙකුට සිතෙන්නට ඉඩ ඇත. මගේ අරමුණ කතුවරයාගේ හිත හොඳ කරන කට පුරා වර්ණනා කිරීමක් හෝ 'දෙන්නම් බැටේ' විචාරයක් නොවන බව යළිත් වරක් සිහිපත් තළ යුතුය.

වයෝවෘධ වුවද තවමත් තරුණයකු මෙන් නිර්මාණ ජවයෙන් පිරුණු හදවතක් ඇති ඩී. බී. කුරුප්පු මහතා ස්වකීය නිර්මාණ පිළිබඳ ඉත සිතින් කරන විවේචන් කියවා ලබන සතුට වැනි සතුටක් මගේ සටහන් කිවීමෙන් ලබනු ඇතැයි මම කල්පනා කරමි.